දිවි තොර කර ගැනීමක් බවට නිශ්චිත නොවන සිදුවීමක් සම්බන්ධයෙන් වාර්තා කිරීමේ දී පවා, මාධ්‍ය මාර්ගෝපදේශයන් පිළිපැදීම අත්‍යවශ්‍ය වේ. මන්දයත්, මාධ්‍ය විසින් එය වාර්තා කරන ආකාරය අනුව, දිවි තොර කර ගැනීමට නැඹුරුවක් ඇති අයෙකුට එයින් දිවි තොර කර ගැනීමක් අනුකරණය සඳහා උත්තේජනයක් ලැබිය හැකි බැවිනි.

මීට නිදසුනක් ලෙසින්, කුරුවිට තරුණයෙකුගේ මරණය අරුණ පුවත්පත වාර්තා කර ඇති ආකාරය සලකා බැලිය හැක.

* මෙහිදී, "මව්පිය ආදරය ලැබිලා තියෙන්නේ අඩුවෙන්", "හිත රිදෙන විට ලියූ කවි මුහුණු පොතේ" වැනි සඳහන් කිරීම ඔස්සේ, දිවි තොර කර ගැනීමක් වීමටද හැකි මෙම මරණය උත්කර්ෂයට නංවමින්, හැඟීම් කළඹවන සුළු ලෙසින් දක්වා තිබුණි.

* දිවි තොර කර ගැනීමට පෙර ලියූ බවට කියැවෙන ලිපියක කොටසක් ද සඳහන් කර තිබිණි.

* දිවි තොර කර ගැනීමක් බවට සැක කරන ආකාරය ද සඳහන් කර තිබිණි.

* දිවි තොර කර ගැනීමක් විය හැකි මෙම පුවත ප්‍රමුඛතාවයෙන් යුතුව පළ කර තිබිණි.

* හදිසි උපකාරක අංක පළ කර නොතිබුණි.

ඉහත දැක්වෙන, දිවි තොර කර ගැනීම් වාර්තාකරණය සම්බන්ධව මාධ්‍ය මාර්ගෝපදේශ උල්ලංඝනයන් සිදු නො කරමින් දිවි තොරකර ගැනීමක් විය හැකි සිදුවීමක් වාර්තා කරන ලෙසට, මාධ්‍ය දිරිමත් කෙරෙනුයේ, දිවි තොරකර ගැනීමේ නැඹුරුතාවයෙන් යුක්ත පුද්ගලයින් අනුකාරක සිදුවීම් වලට පෙළඹීම වැලැක්වීමටත්, ඒ ඔස්සේ එක් ජීවිතයක් හෝ බේරා ගැනීමටත් වේ.

ඒ අනුව බලන විට, වගකීම් සහගතව සහ ආචාර ධාර්මිකව දෙවි තොර කර ගැනීම සම්බන්ධයෙන් වාර්තා කිරීම මාධ්‍ය අතර ඇති සමාජ වගකීමක් බවද පැවසිය යුතු වේ.

උපකාරක අංක පළ කරමු, ජීවිතයක් රැක ගනිමු!

හදිසි උපකාරක අංක:
*CCCline - 1333
*ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0707308308
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය - 1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)

(මෙම පුවත, මෙම දිනයේ මෙම පුවත්පතෙහි සහෝදර ඉංග්‍රීසි පුවත්පත තුළ පළ වී නොතිබුණි.)

**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.

*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!